රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 04/2011

මගේ අංකය :CS /ICTS/01/Abs.Committee
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 7.
2011.02.15

සියලුම අමාත්‍යාංශ ලේකම්වරු,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් ,
දිස්ත්‍රික් ලේකම්වරුන්/ දිසාපතිවරුන් ,
ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත.

ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයට අන්තර්ග්‍රහණය කිරීම

අංක 1631/20 හා 2009.12.09 දින දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා ව්‍යවස්ථා සංග්‍රහය 2009.07.01 දින සිට ක්‍රියාත්මක වේ.

**02.** අන්තර්ග්‍රහණය කිරීම

ඉහත කී සේවා ව්‍යවස්ථාවේ හා එහි 10 වන වගන්තියේ විධිවිධාන පරිදි කැඳවන ලද තොරතුරු අනුව, ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයට අන්තර්ග්‍රහණය වීමට මනාපය පළ කර ඇති නිලධාරීන්, සේවා ව්‍යවස්ථාවේ 1 වන උපලේඛනයේ දැක්වෙන උපලේඛන ගත තනතුරුවලට පහත සඳහන් විධිවිධානවලට යටත්ව, 2009.07.01 දින සිට අන්තර්ග්‍රහණය කරනු ලැබේ. එම නිලධාරීන් 2009.07.01 දින සිට ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා ව්‍යවස්ථාවේ පූර්ණ පාලනයට යටත් වේ.

2.1 අන්තර්ග්‍රහණය කරනු ලබන්නේ විධිමත් පරිදි අමාත්‍ය මණ්ඩලය හෝ ජාතික අයවැය දෙපාර්තමේන්තුව/ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් නිශ්චිත වශයෙන්ම පරිගණක තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂයකට අදාලව අනුමත කරන ලද තනතුරකට සහ එම තනතුර සඳහා විධිමත් පරිදි අනුමත කරන ලද බඳවාගැනීමේ හෝ උසස්කිරීමේ පරිපාටියකට අනුව 2009.12.09 දින හෝ එදිනට පෙර පත්කිරීම් හෝ උසස්කිරීම් මඟින් පත් කර දැනට සේවය කරනු ලබන හෝ සේවය කරනු ලැබූ ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත නිලධාරීන් පමණි. **2009.07.01**දින සිට 2009.12.09 දින දක්වා කාලය තුළ බඳවා ගත් අය අන්තර්ග්‍රහණය කරනු ලබන්නේ අදාළ තනතුරට පත්වීම ලද දින සිටය.

2.2 යම් නිලධාරියෙකු බඳවා ගන්නා / උසස් කරන අවස්ථාවේ ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ/ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා නොමැති වුවද, පසු අවස්ථාවක හෝ එම තනතුරු සඳහා විධිමත් අනුමැතියක් ලබා ඇත්නම්, අන්තර්ග්‍රහණ ක්‍රියාවලියේදී එම තනතුර අනුමත තනතුරක් සේ සලකනු ලැබේ.

**2.3** (i) ශ්‍රේණිගත නිලධාරීන්

දැනට විධිමත් පරිදි බඳවාගෙන හෝ උසස්වීම් ලබා ශ්‍රේණිගතව සිටින නිලධරයන් එම ශ්‍රේණිය අනුව අදාල පන්තියේ නියමිත ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ. අන්තර්ග්‍රහණය කිරීමෙන් පසු අන්තර්ග්‍රහණය කළ මට්ටමට වඩා ඉහළ මට්ටමේ පන්තියට/ශ්‍රේණියට උසස් කිරීම එකී පන්තියට/ශ්‍රේණියට අවශ්‍ය සුදුසුකම් සපුරා තිබීම මත රඳා පවතිනු ඇත.

2.3 (ii)ශ්‍රේණිගත නොවන නිලධාරීන්

ශ්‍රේණිගත නොවන නිලධාරීන් අදාල පන්තියේ වැටුප් පරිමාණයේ ආරම්භක ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ඇත.

එකී සුදුසුකම් සපුරා නොමැති නිලධාරීන්ට පහත 05 වන ඡේදයේ දැක්වෙන පරිදි අදාල සුදුසුකම් සපුරා ගැනීම සඳහා සහන කාලයක් ලබා දෙන අතර එම කාලසීමාව තුළ එය සම්පූර්ණ කර ගත යුතුය. එසේ සුදුසුකම් සපුරා නොගන්නා නිලධරයන් පිළිබඳව ආයතන සංග්‍රහයේ හා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති සංග්‍රහයේ දැක්වෙන විධිවිධාන අනුව කටයුතු කරනු ලැබේ.

2.4 2009.06.30 හෝ එදිනට පෙර විශ්‍රාම ගිය නිලධරයන්ට සේවා ව්‍යවස්ථාවේ සඳහන් විධිවිධාන අදාල නොවේ.

**03.** __අන්තර්ග්‍රහණය සඳහා මනාපය පළ නොකර විශ්‍රාම යාමට මනාපය පළ කළ නිලධරයන්__

**3**.1 අන්තර්ග්‍රහණය සඳහා මනාපය පළ නොකර විශ්‍රාම යාමට මනාපය පළ කළ නිලධරයන්ට මෙම චක්‍රලේඛයේ විධිවිධාන අදාල නොවේ. එම නිලධරයන් විශ්‍රාම ගැන්වීම් දැනට දරනු ලබන තනතුරේ පත්වීම් බලධාරීන් මඟින් සිදු කරනු ඇත. විශ්‍රාම යාම සඳහා පළ කර ඇති මනාපය කිසිදු හේතුවක් මත වෙනස් කළ නොහැකිය.

3.2 අන්තර්ග්‍රහණය සඳහා හෝ විශ්‍රාම ගැනීම සඳහා හෝ මනාපය පළ නොකළ නිලධරයන් වේ නම් සේවා ව්‍යවස්ථාවේ 11.2 වගන්තියේ විධිවිධාන අදාල වේ.

**04.** __සේවා කාලය__

4.1 තනතුරකට පත්කිරීමෙන් හෝ උසස්කිරීමෙන් අනතුරුව ඊට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ඇත්නම් හා පත්වීම්/උසස්වීම් දිනය පිළිබඳව විශේෂ විධිවිධාන අමාත්‍ය මණ්ඩල තීරණයේ ඇතුලත් කර නොමැති නම්, අමාත්‍ය මණ්ඩල තීරණයේ දිනය පත්වීම් දිනය/උසස්වීම් දිනය ලෙස සලකන අතර, සේවා කාලය ඒ අනුව ගණනය කරනු ඇත.

4.2 තනතුරකට පත්කිරීමෙන් හෝ උසස්කිරීමෙන් අනතුරුව ඉහත 2.2 පරිදි අනුමැතිය ලබා ඇත්නම්, එවැනි නිලධරයකුගේ සේවා කාලය ලෙස සලකන්නේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව හෝ ජාතික අයවැය දෙපාර්තමේන්තුව මඟින් තනතුර අනුමත කරන ලද දිනයේ සිට වූ සේවා කාලයයි.

4.3 පරිගණක තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂයට පරිබාහිර සේවයකින්/තනතුරකින් විධිමත්ව මුදාහැර වත්මන් තනතුරට පත්වූයේ නම්, එකී පරිබාහිර සේවා කාලය මෙම සේවා ව්‍යවස්ථාවේ විධිවිධානයන්ට අදාළ සේවා කාලයක් ලෙස සලකනු නොලැබේ. (එම සේවා කාලය විශ්‍රාම වැටුප් ගණනය කිරීම සඳහා පමණක් සලකා බලනු ලැබේ.)

**05.** __අන්තර්කාලීන විධිවිධාන__

අන්තර්ග්‍රහණය කිරීමේදී, සේවා ව්‍යවස්ථාවේ සඳහන් සුදුසුකම් සපුරන අය පමණක් අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

සේවා ව්‍යවස්ථාව අනුව අවශ්‍ය සුදුසුකම් සපුරා නැති, දැනට සේවයේ සිටින නිලධරයන්ට අදාළ සුදුසුකම් සපුරා ගැනීම සඳහා 2013.12.31 දක්වා සහන කාලයක් දෙනු ලැබේ. එම කාලය තුළ ඔවුන් විසින් පහත පරිදි අවශ්‍ය සුදුසුකම් සපුරා ගත යුතුය. එකී නිලධාරීන් එම කාලය තුළ ඔවුන්ගේ පැරණි තනතුරු නාමය යටතේ, පැරණි වැටුප් පරිමාණය මත වැටුප් ලැබිය යුතු වේ.

**5.1 3 පන්තියට අන්තර්ග්‍රහණය කරනු ලබන නිලධරයන්**

5.1 (i) (අ) සේවා ව්‍යවස්ථාවේ 8.1.1 (ඉ) වගන්තියේ සඳහන් අ.පො.ස.(සා.පෙළ) සුදුසුකම සම්පූර්ණ කර තිබිය යුතුය.

(ආ) සේවා ව්‍යවස්ථාවේ 8.1.1 (ඉ) වගන්තියේ සඳහන් අ.පො.ස(උ.පෙළ) සුදුසුකම් අන්තර්ග්‍රහණය කිරීම සඳහා අනිවාර්ය අවශ්‍යතාවක් නොවනු ඇත.

5.1 (ii) සේවා ව්‍යවස්ථාවේ 8.1.1 (ඊ) වගන්තියට අනුව සම්පූර්ණ කළ යුතු වෘත්තීය පාඨමාලාව නොමැති අයට ඒ වෙනුවට අන්තර්ග්‍රහණයේදී පහත සුදුසුකම් සලකා බලා එම වෘත්තීය පාඨමාලා පිළිබඳ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ.

(අ) තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ශ්‍රේණිගත කරන ලද ජාතික වෘත්තීය යෝග්‍යතා 5 වන මට්ටමේ (NVQ 5) ප්‍රවීණතාවයක් ලබා තිබීම.

හෝ

(ආ) තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව හෝ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක පරිගණක සහ තොරතුරු තාක්ෂණය හා සම්බන්ධ ඕනෑම විෂය මාලාවකින් යුතු අවම වශයෙන් පැය 720 ක කාලයක් ආවරණය වන පාඨමාලාවක් සතුටුදායක ලෙස සම්පූර්ණ කර සහතිකයක් ලබා තිබීම.

5.1 (iii) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක පරිගණක/ තොරතුරු තාක්ෂණය ප්‍රධාන විෂයක් සහිතව ඇති උපාධි හෝ පරිගණක/ තොරතුරු තාක්ෂණ උපාධි ලබා සිටින නිලධාරීන් සේවා ව්‍යවස්ථාවේ 8.1.1 වගන්තියේ සඳහන් වෘත්තීය සුදුසුකම් ලබාගත් අය සේ සලකනු ලැබේ.

5.1 (iv) විශ්‍රාම යාමේ වයසට එළඹ සිටින නිලධාරීන්

2009.07.01 වන විට අවුරුදු 55 සම්පූර්ණ වූ, අදාල මූලික අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සපුරා නොමැති නිලධාරීන් රාජ්‍ය සේවා පුහුණු ආයතනය මඟින් හෝ පත්වීම් බලධරයා විසින් නියම කරනු ලබන ආයතනයක් මඟින් පැවැත්වීමට සැලසුම් කර ඇති පරිගණක පාඨමාලාව සහනකාලය තුළ හදාරා සම්පූර්ණ කළ යුතුය.

**5.2 2 පන්තියට අන්තර්ග්‍රහණය කරනු ලබන නිලධරයන්**

5.2 (i) දැනටමත් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 හි හෝ සංශෝධන වශයෙන් හඳුන්වා දී ඇති චක්‍රලේඛ අනුව MN 6-2006 A වැටුප් පරිමාණයේ වැටුප් ලබන නමුත්, සේවාවේ 2 පන්තියේ I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය නොවන, එහෙත් විධිමත් පරිදි අනුමත කර ඇති තනතුරු දරන්නේ නම් සේවාවේ 2 පන්තියේ II ශ්‍රේණියට (නියමිත සුදුසුකම් සපුරා ඇත්නම්) අන්තර්ග්‍රහණය කරනු ඇත.

5.2 (ii) MN 6-2006 A වැටුප් පරිමාණයේ 12 පියවර හෝ ඊට ඉහළ පියවරක් හෝ MN 7-2006 A වැටුප් පරිමාණයේ වැටුප් ලබන අය (සුදුසුකම් සපුරා ඇතිනම්) සේවාවේ 2 පන්තියේ I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

5.2 (iii)MN 6-2006 A වැටුප් පරිමාණයෙන් පරිබාහිර වූ වැටුප් ක්‍රම මත වැටුප් ලබන, පරිගණක ක්ෂේත්‍රයට අදාලව අනුමත කර ඇති තනතුරුවල සේවය කරන අනෙකුත් නිලධාරීන් සේවයේ 2 පන්තියට අන්තර්ග්‍රහණය කළ යුත්තේ,

5.2 (iii)(අ) ආයතනයේ පවත්නා අවශ්‍යතාවයන් අනුව ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 2 වැනි පන්තියට අදාල තනතුරක් කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරන්නේ නම්;

සහ

5.2 (iii)(ආ) අදාල නිලධාරියා ඉහත (අ) යටතේ ඇති කරනු ලබන තනතුරට පත්කිරීමට අවශ්‍ය අනෙකුත් සියලු සුදුසුකම් හා කොන්දේසි සපුරා තිබේ නම් පමණි.

**5.3 1 පන්තියට අන්තර්ග්‍රහණය කරනු ලබන නිලධරයන්**

5.3 (i)දැනට SL 1-2006 වැටුප් ක්‍රමයේ වැටුප් ලබන අය හෝ මෙම සේවා ව්‍යවස්ථාවේ 1 පන්තියට අදාළ හෝ සමාන තනතුරක සේවය කරනු ලබන නිලධාරීන් (අවශ්‍ය සුදුසුකම් සපුරා තිබේනම්) අදාළ ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

5.3 (ii)සේවා ව්‍යවස්ථාවේ 8.6.1 (ඉ) වගන්තියේ පරිදි වන සුදුසුකම් සම්පූර්ණ කර නොමැති නිලධරයන් ලබාදෙන සහන කාලය තුලදී තොරතුරු තාක්ෂණය පිළිබද පශ්චාත් උපාධි ඩිප්ලෝමා සුදුසුකම් ලබා ගැනීමෙන් පසු අන්තර්ග්‍රහණය සඳහා සලකා බලනු ඇත.

**06.** <u>**ජ්‍යෙෂ්ඨත්වය හා වැටුප**</u>

6.1 නියමිත සුදුසුකම් සහිතව අන්තර්ග්‍රහණය වන නිලධාරීන්ට ඉහත 4 ඡේදයේ විස්තර වන පරිදි ගණනය කරනු ලබන පෙර සේවා කාලය පදනම් කර ගෙන අන්තර්ග්‍රහණ දින සිට ජ්‍යෙෂ්ඨත්වය හිමි වේ. පූර්ව තනතුරට බඳවාගත් / උසස්වීම්ලත් දිනය, තනතුර, පදනම් කර ගනිමින් එක් එක් ශ්‍රේණිය සඳහා ජ්‍යෙෂ්ඨතා ලේඛනයක් සකස් කරනු ලැබේ.

අන්තර්කාලය තුළ නියමිත සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් එසේ සුදුසුකම් සම්පූර්ණ කරන දින සිට ඒ ඒ පන්තියේ / ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨත්වයෙහි පිහිටුවනු ඇත.

6.2 අන්තර්ග්‍රහණයවීමේදී යම් නිලධාරියෙකුගේ නව වැටුප් පරිමාණය පෙර ලැබූ වැටුප් පරිමාණය හා වෙනස් වන අවස්ථාවක් තිබේනම්, ඔහුගේ වැටුප 2009.07.01 දින සිට වලංගු වන පරිදි ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4 වන වගන්තියේ විධිවිධාන අනුව පරිවර්තනය කරන අතර, 2010.12.31 දක්වා හිඟ වැටුප් ගෙවනු නොලැබේ. එසේ වුවත් පැවති වැටුප් වර්ධක දිනය වෙනස් නොවේ.

6.3 යම් කිසි නිලධරයකු තනතුර ලබා ගැනීමට මනාපය පළ කරන නමුත් එම තනතුරට හිමි වැටුප ලබා ගැනීම ප්‍රතික්ෂේප කරන්නේ නම් එම නිලධරයා එතෙක් ලබමින් සිටි වැටුප ඔහුට / ඇයට පෞද්ගලික වන සේ හිමිවනු ඇත. මේ සඳහා කරනු ලබන මනාපය, පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

**07.** <u>**ස්ථිර කිරීම, කාර්යක්ෂමතා කඩඉම් හා උසස්වීම්**</u>

7.1 පූර්ව තනතුරේ බඳවාගැනීම් පටිපාටි යටතේ බඳවාගන්නා ලද නමුත්, 2009.07.01 දින වන විට ස්ථිර කර නොමැති නව සේවයට අන්තර්ග්‍රහණය කරනු ලබන නිලධරයන් අන්තර්ග්‍රහණය කරන ලද පන්තියේ ඒ ඒ ශ්‍රේණිවලට අදාල කාර්යක්ෂමතා කඩඉම් විභාගය සම්පූර්ණ කළ පසුව, නව සේවා ව්‍යවස්ථාව යටතේ ස්ථිර කිරීම පත්වීම් බලධරයා විසින් කරනු ලැබේ.

7.2 සේවා ව්‍යවස්ථාවේ 7.3, 7.4, හා 7.5 වගන්තිවල දැක්වෙන කාර්යක්ෂමතා කඩඉම් විභාග 2009.07.01 දින සිට අන්තර්ග්‍රහණය කරන ලද නිලධරයන්ට අදාල වේ.

7.3 අන්තර්ග්‍රහණය කරනු ලබන නිලධරයන් නව සේවා ව්‍යවස්ථාවට අනුව සමත් විය යුතු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ වලට ඇතුලත් යම් විෂයයක් ඉහත 04 ඡේදයේ පරිදි සේවා කාලයට ඇතුළත්වන පූර්ව තනතුර දරමින් සිටියදී සමත් වී ඇත්නම් නිලධරයන්ගේ ඉල්ලීම මත එම විෂය නැවත සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කිරීමට පත්වීම් බලධරයා විසින් කටයුතු කරනු ඇත.

7.4 පූර්ව තනතුරේ බඳවා ගැනීම් පටිපාටියේ කාර්යක්ෂමතා කඩඉම් සඳහන්ව නොමැති විට හෝ පත්වීම් ලිපියේ කාර්යක්ෂමතා කඩඉම් පිළිබඳ සඳහන් නොවීම මත කාර්යක්ෂමතා කඩඉම් සම්පූර්ණ කර නොමැති නිලධාරීන් සිටිනම් ඉහතින් දැක්වූ අදාල පංතියේ නියමිත ශ්‍රේණියට අදාල කාර්යක්ෂමතා කඩඉම අන්තර්කාලය තුලදී සම්පූර්ණ කළ යුතුය.

## 08. <u>නොනිමි කාර්යයන්</u>

8.1 පූර්ව තනතුරේ බඳවාගැනීම් පටිපාටිය යටතේ ඒ ඒ පත්වීම් බලධරයන් විසින් 2009.07.01 දිනට පෙර ආරම්භ කරන ලද සියලුම ආයතන කටයුතු අවසන් කළ යුතුය.

8.2 පූර්ව තනතුරේ යෙදී සිටියදී චෝදනා පත්‍ර නිකුත් කර ඇති හා විධිමත් විනය පරීක්ෂණ ආරම්භ කර ඇති නිලධරයන්ගේ විනය ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ 10 වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතු අතර අනෙකුත් විනය ක්‍රියාමාර්ග පිළිබඳව කටයුතු කිරීමට ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කළ යුතුය.

## 09. <u>පාඨ අතර අනනුකූලතාවයක් ඇති වූ විට ක්‍රියා කරන ආකාරය</u>

මෙම චක්‍රලේඛයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් හෝ පරස්පරතාවයක් හෝ ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු වන්නේය.

## 10. <u>චක්‍රලේඛය මගින් විධිවිධාන සලසා නොමැති කරුණු</u>

මෙම චක්‍රලේඛය මගින් විධිවිධාන සලසා නොමැති කරුණු වෙතොත් ඒ සම්බන්ධව තීරණ ගැනීම රාජ්‍ය පරිපාලන විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් විසින් සිදු කරනු ඇත.

11. මෙම චක්‍රලේඛය නිකුත් කරනුයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ එකඟතාවය ඇතිවය.

පී.බී.අබේකෝන්
ලේකම්,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය